අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 459

සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ
අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත.

**<u>ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ නිලධාරීන්ගේ වැටුප සකස් කිරීම</u>**

අධිකරණ රෙජිස්ට්‍රාර්වරයෙකුගේ විශ්‍රාම වැටුප ගණනය කිරීමට අදාලව ඔහුගේ වැටුප හා ශ්‍රේණිය පරස්පර බවට සඳහන් කරමින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් එවන ලද 2021.06.30 දිනැති ලිපියක් සහ අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ දත්ත මාර්ගගත ක්‍රමය ඔස්සේ ඇතුලත් කිරීමේදී ගැටලු මතුවන බවට දන්වමින් ගම්පහ දිසා විනිසුරු විසින් එවන ලද 2020.12.17 දිනැති ලිපියක් පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව **<u>පහත සඳහන් කරුණු</u>** විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දැන්වීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සාකච්ජාවක් පැවැත්වීමට නියම කරන ලදී.

I. 2019.10.16 දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ නිලධාරීන් අතර "ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ නිලධාරීන්ගේ වැටුප් හා ශ්‍රේණිය නොගැලපීම" සම්බන්ධයෙන් පවත්වා ඇති සාකච්ජාවේදී, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018.11.13 දිනැති ලිපියෙන් අනුමත කර ඇති ශ්‍රේණි හා වැටුප් තල විශ්‍රාම වැටුප් කළමණාකරන පද්ධතියට ඇතුලත් කිරීමට තීරණය කර ඇති බව.

II. 2019.10.16 දින සාකච්ජාවට අනුව විශ්‍රම වැටුප් කළමනාකරණ (මාර්ග ගත) පද්ධතිය සකස් කර තිබූ නමුත්, පසුව අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත කිසිදු දැනුම්දීමකින් තොරව එම පද්ධතිය වෙනස් කර ඇති බව.

III. ඒ අනුව විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතියට අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන්ගේ වැටුප් පිළිබඳ නිවැරදි විස්තර (ශ්‍රේණි හා වැටුප්තල පිළිබඳ විස්තර) ඇතුලත් කර නැවත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ පද්ධතිය නිවැරදි කලයුතු බව.

02. ඒ අනුව අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ නිලධාරීන් ඉහත කරුණු සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ 2022.04.21 දින සාකච්ජාවක් පවත්වන ලද අතර එම සාකච්ජාවේ දී ඇතිකරගත් තීරණය පහත පරිදි උපුටා දක්වමි.

**"මෙම ගැටලුව නිරාකරණය කිරීම සඳහා අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන්ගේ විශ්‍රාම වැටුප සකස් කිරීමට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන I හි 4 වන තීරුව ප්‍රකාරව බඳවා ගැනීම් පටිපාටිය අනුව දත්ත පද්ධතිය සකස් කිරීමට තීරණය විය"**

03. ඒ අනුව ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ වැටුප් හා විශ්‍රාම වැටුප් සකස් කිරීමේදී පහත පරිදි කටයුතු කරන ලෙස මෙයින් දන්වමි.

I. මුලින්ම ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවය සඳහා අනුමත වී ඇති වැටුප් පරිමාණ, වැටුප් පියවර සහ වැටුප් තල පිළිබඳ ඔබගේ අවධානය යොමුකරවමි.

අධිකරණ රෙජිස්ට්‍රාර් III ශ්‍රේණියේ ආරම්භක වැටුප් පියවර
වැටුප් කේත අංකය - MN 7 -2016
වැටුප් පරිමාණය - 41,580 - 11x755 - 18x1, 030 - 68,425

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය |
|---|---|---|
| III ශ්‍රේණිය | පියවර 03 | රු. 43,090 |

අධිකරණ රෙජිස්ට්‍රාර් II ශ්‍රේණිය II පන්තිය, II ශ්‍රේණිය I පන්තිය හා I ශ්‍රේණිය
වැටුප් කේත අංකය - SL 1-2016
වැටුප් පරිමාණය - 47,615 - 10x1, 335 - 8x1, 630 - 17x2,170 - 110,895

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය |
|---|---|---|
| II ශ්‍රේණිය II පන්තිය | පියවර 01 | රු. 47,615 |
| II ශ්‍රේණිය I පන්තිය | පියවර 03 | රු. 50,285 |
| I ශ්‍රේණිය | පියවර 08 | රු. 56,960 |

II. අධිකරණ රෙජිස්ට්‍රාර් II-II ශ්‍රේණියට පත්කරනු ලබන නිලධාරීන් SL-1-2016 වැටුප් පරිමාණයේ 4 වන තීරුවේ සඳහන් පරිදි 1 වන වැටුප් පියවර එනම් රු.47,615/- ක වැටුපෙන් පටන්ගෙන 11 (එකොළොස්වන) වන වැටුප් පියවර දක්වා වැටුප් ගෙවිය යුතුය. අධිකරණ රෙජිස්ට්‍රාර් II- I ශ්‍රේණියට උසස් කරන ලද නිලධාරීන්ගේ වැටුපද එලෙසම 11 (එකොළොස්වන) වැටුප් පියවර දක්වා ගෙවිය යුතුය.

III. අධිකරණ රෙජිස්ට්‍රාර් I ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන් 12 වන වැටුප් පියවරේ සිට විශ්‍රාම යනතුරුම හෝ යම් ආකාරයකින් සේවය අවසන් වනතුරුම SL-1-2016 වැටුප් පරිමාණයේ 4 වන තීරුවේ සඳහන් පරිදිම වැටුප් ගෙවිය යුතුය.

IV. අධිකරණ රෙජිස්ට්‍රාර් I ශ්‍රේණියට උසස් වීමක් නොලද නිලධාරීන්ට 11 වන වැටුප් පියවර දක්වා එනම් රු.60,965/- දක්වා 4 වන තීරුව යටතේ වැටුප් ගෙවිය යුතු වන අතර 12 වන වැටුප් පියවරෙහි සිට SL-1-2016 වැටුප් පරිමාණයේ 5 වන තීරුවේ (උසස් වීමක් නොලද තීරුවේ) සඳහන් පරිදි එනම් රු.62,300/-වැටුප් තලයේ සිට ඉදිරියට වැටුප් ගෙවිය යුතුය.

V. SL-1-2016 වැටුප් පරිමාණයේ 5 වන තීරුවේ (උසස් වීමක් නොලද තීරුවේ) වැටුපක් ලබන යම් නිලධාරියෙකු අධිකරණ රෙජිස්ට්‍රාර් I ශ්‍රේණියට උසස්වීම් ලැබුවේනම් එම නිලධාරියාගේ වැටුප ආයතන සංග්‍රහයේ VII වන පරිච්ජේදයේ 5 වගන්තිය ප්‍රකාරව උසස්වීම ක්‍රියාත්මක වන දින සිට ඉහත කී වැටුප් පරිමාණයේ 4 වන තීරුවේ වැටුපක පිහිටුවිය යුතුය.

VI. අධිකරණ රෙජිස්ට්‍රාර් I ශ්‍රේණියට උසස්වීම් නොලද නිලධාරීන්ට 5 වන තීරුවේ (උසස් වීමක් නොලද තීරුවේ) 17 වන වැටුප් පියවරින් පසුව එනම් රු. 68,975/- වැටුපෙන් පසුව විශ්‍රාම යනතුරුම හෝ යම් ආකාරයකින් සේවය අවසන් වනතුරුම රු.1,335/-ක වැටුප් වර්ධකයක් බැගින් ගෙවිය යුතුය. එවැනි යම් නිලධාරියෙකු අධිකරණ රෙජිස්ට්‍රාර් I ශ්‍රේණියට උසස්වීම් ලැබුවේනම් එම නිලධාරියාගේ වැටුප ආයතන සංග්‍රහයේ VII වන පරිච්ජේදයේ 5 වගන්තිය ප්‍රකාරව උසස්වීම ක්‍රියාත්මක වන දින සිට SL-1-2016 වැටුප් පරිමාණයේ 4 වන තීරුවේ වැටුපක පිහිටුවිය යුතුය.

04. අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත කිසිදු දැනුම් දීමකින් තොරව ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ නිලධාරීන්ගේ වැටුප් සම්බන්ධව ඇතැම් අධිකරණවල සේවයේ නියුතු නිලධාරීන් විසින් සෘජුවම වෙනත් ආයතන වලට දැන්වීම සහ වෙනත් ආයතන වලින් විමසීමට කටයුතු කිරීම මඟින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ පද්ධතිය වෙනස් කිරීම හේතුවෙන් අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ නිලධාරීන් බොහෝ දෙනෙකුගේ විශ්‍රාම වැටුප් සකස් කිරීම බොහෝ සෙයින් ප්‍රමාද වී ඇති බව සහ ඒ හේතුවෙන් එකී නිලධාරීන්ට ලැබිය යුතු විශ්‍රාම වැටුප් දීර්ඝ කාලයක් තිස්සේ නොලැබී ගොස් ඇති බව යන කරුණු අධිකරණ සේවා කොමිෂන් සභාවේ දැඩි අවධානයට යොමුව ඇති බව මෙයින් දැනුම් දෙන අතර අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ නිලධාරීන් ඒ සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ 2022.04.21 දින පවත්වන ලද සාකච්ඡාවෙන් පසු විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය නිවැරදි කිරීමට කටයුතු කරන ලද බවත් ඔබගේ අවධානයට යොමු කරමි.

05. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ නිලධාරීන්ගේ වැටුප් පිළිබඳව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ පත්වීම් බලධරයා වන අධිකරණ සේවා කොමිෂන් සභාව වෙතින් පමණක් විමසිය යුතු බවත් අධිකරණ සේවා කොමිෂන් සභාවේ පූර්ව අවසරයකින් තොරව වෙනත් ආයතන වලට දැන්වීමෙන් සහ වෙනත් ආයතන වලින් විමසීමට කටයුතු කිරීමෙන් මින් ඉදිරියට වැලකී සිටිය යුතු බවත් වැඩිදුරටත් මෙයින් දන්වමි.

06. තවද මෙම චක්‍රලේඛයේ විධිවිධාන පිළිබඳව තවදුරටත් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් ඒ පිළිබඳ විමසීම් 'ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව' වෙත ලිඛිතව ඉදිරිපත් කිරීමෙන් සිදුකල යුතුය.

එච්.සංජීව සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2023 පෙබරවාරි මස 28 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.